# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

## (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ(නීති) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

## අධ්‍යක්ෂ (නීති) – තනතුරු 01

**සුදුසුකම් :**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම

**සහ**

නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (Master of Law) සුදුසුකම් ලබා තිබීම

**සහ**

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නීති කෘත්‍යයන් සඳහා පෙනී සිටීම ඇතුළත්ව තනතුරුට අදාළව නීති ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද

**වයස :** අවුරුදු 35 නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය** : HM 1-1 – 2025 - රු. (140,640 - 15 X 4,100 - 202,140)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. | අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කාර්ය සාධනය | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

**පොදු කොන්දේසි**

1. රාජ්‍ය හෝ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීතිවලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් තම සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් 2026.05.25 දින ප.ව. 4.00 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි "අධ්‍යක්ෂ (නීති)" ලෙස සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203, ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,**
**කොළඹ 07.**